Remove Watermark Wondershare PDFelement

6 ශ්‍රේණිය

විද්‍යාව

නම/ විභාග අංකයඃ

I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- 1 සිට 15 දක්වා වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඉරක් අඳින්න.

01. ජීවීන් තුළ සංචිතව ඇති ආහාර මත ඔක්සිජන් ක්‍රියාකර ශක්තිය නිපදවීමේ ක්‍රියාවලිය,

(1) වර්ධනය යි. (2) ප්‍රජනනය යි. (3) ශ්වසනය යි. (4) පෝෂණය යි.

02. ද්‍රව්‍යයක් මිටියකින් තැලූ විට කුඩු බවට පත් නොවී තහඩු බවට පත් කළ හැකි වීම.

(1) භංගුරතාවයයි. (2) ආඝාත්‍යතාවයයි.

(3) දෘඪතාවයයි. (4) තන්‍යතාවයයි.

03. චුම්භකයක චුම්භක ගුණ වැඩි වශයෙන්ම පවතින ස්ථානය වන්නේ,

(1) උත්තර ධ්‍රැවයේ ය. (2) දක්ෂිණ ධ්‍රැවයේ ය.

(3) චුම්භකයේ මැද ය. (4) ධ්‍රැව දෙකෙහි ය.

04. වැඩි ලවණ ප්‍රමාණයක් දිය වී ඇති ජලය වනුයේ,

(1) කිවුල් ජලයේ ය. (2) මිරිදියේ ය. (3) කරදියේ ය. (4) බොර දියේ ය.

05. පොසිල ඉන්ධනවලට උදාහරණ <u>පමණක්</u> අඩංගු පිළිතුර වනුයේ,

(1) ගල් අඟුරු, ඩීසල්, භූමිතෙල් (2) අඟුරු, භූමිතෙල්, පොල්තෙල්

(3) ගල් අඟුරු, ඩීසල්, පොල්තෙල් (4) අඟුරු, භූමිතෙල්, ඩීසල්

06. මිනිසාට බීමට ගත හැකි ජල ප්‍රමාණය පෘථිවියේ ඇති ජල ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස,

(1) 1.01 කි. (2) 0.01 කි (3) 0.1 කි (4) 0.001 කි.

07. ශක්ති ප්‍රභවයක් ලෙස සැලකිය හැක්කේ,

(1) පොල්තෙල් ය. (2) ගල් අඟුරු ය. (3) ඩීසල් ය. (4) පොසිල ඉන්ධන ය.

08. ශක්තීන් කිහිපයක් පිළිබඳ ළමයෙකු කළ ප්‍රකාශ හතරක් පහත දැක්වේ. ඉන් නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) ආලෝකයේ ප්‍රයෝජන මෙන්ම හානි ද ඇත.

(2) ධ්වනියේ ප්‍රයෝජන පමණක් ඇත.

(3) ආලෝකයේ ප්‍රයෝජන පමණක් ඇත.

(4) අපට ප්‍රයෝජනවත් වන ශක්ති වනුයේ ආලෝකය හා ධ්වනියයි.

LIVEWORKSHEETS

Remove Watermark Wondershare PDFelement

09. පවුඩර්වල ඇති භෞතික ගුණය වනුයේ,

(1) තන්‍යතාවය (2) ආඝාතවර්ධ්‍යතාවය (3) සිනිඳුභාවය (4) ප්‍රත්‍යස්ථතාවය

10. සමාන්තර ආලෝක කදම්භයක් නිවැරදිව ඇඳ ඇත්තේ කුමන පිළිතුරේ ද?

(1)  (2) (3)  (4) 

11. විදුලිය නිපදවීම සඳහා ශ්‍රී ලංකාවට වඩාත් සුදුසු වන ශක්ති ප්‍රභවය වන්නේ

(1) ජල විදුලිය හා න්‍යෂ්ටික බලය (2) උදම් රළ හා සූර්ය ශක්තිය

(3) සූර්ය ශක්තිය හා සුළං ශක්තිය (4) භූ තාපය හා න්‍යෂ්ටික බලය

12. ජලය පිළිබඳ පහත ප්‍රකාශවලින් නිවැරදි වන්නේ,

(1) වර්ෂා ජලයේ ලවණ ඇත.

(2) මුහුදු ජලය ලුණු රස වී ඇත්තේ දියවී ඇති ලවණ නිසාය.

(3) කරදියේ ඇති ලවණ ප්‍රමාණය කිවුල් දියේ ඇති ලවණ ප්‍රමාණයට වඩා අඩුය.

(4) මිරිදියේ සුළු වශයෙන් ලවණ නැත.

13. ප්‍රාශ්වාස වාතයේ කාබන්ඩයොක්සයිඩ් ඇති බව හඳුනාගැනීමට යොදාගතහැකි ද්‍රව්‍යයකි.

(1) හුණුගල් (2) පල්මානික්කම්

(3) කෝබෝල්ට් ක්ලෝරයිඩ් (4) අවර්ණ හුණු දියර

14. ශාක ස්වංපෝෂීන් ලෙස හඳුන්වන්නේ

(1) අවශ්‍ය ආහාර පසෙන් අවශෝෂණය කරන නිසාය.

(2) ශාකවල හරිතප්‍රද වර්ණකය අඩංගු නිසාය.

(3) ශාක ජීව ලෝකයට ආහාර සපයන නිසාය.

(4) තමන්ට අවශ්‍ය ආහාර තමා නිෂ්පාදනය කර ගන්නා නිසාය.

15. ශාක චලනවලට උදාහරණයක් ලෙස ගත <u>නොහැක්කේ</u>

(1) රාත්‍රී කාලයේ සියඹලා පත්‍ර හැකිලීම. (2) නිදිකුම්බා පත්‍ර අතින් ඇල්ලූවිට හැකිලීම

(3) ජලය නොමැතිවීම නිසා ශාක මියයෑම. (4) ශාකයක අග්‍රස්තය සූර්යාලෝකය දෙසට හැරීම

- **අංක 16 - 20 දක්වා වරහන් තුළ ඇති පද වලින් හිස්තැන් සම්පූර්ණ කරන්න.**

(ස්වයංපෝෂීන්, විෂමපෝෂීන්, පදාර්ථය, පාරදෘශ්‍ය, ශක්තිය, ධ්වනිය)

16. ස්කන්ධයක් ඇති අවකාශයේ ඉඩක් ගන්නා ද්‍රව්‍ය .... වේ.

17. ශාකමත වක්‍රව හෝ ඍජුව යැපෙන ජීවීන් .... වේ.

18. ක්‍රමවත්ව අලෝකය ගමන් කරන මාධ්‍ය .... වේ.

19. ද්‍රව්‍යයක් කම්පනය නිසා .... උපදී.

20. කාර්යයක් කිරීමට ඇති හැකියාව .... වේ.

LIVEWORKSHEETS